මාධ්‍ය නිවේදන - අංක 78

## මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්ද දායකයන්ට ස්වකීය ඡන්දය සලකුණු කිරීම සඳහා අවැසි නම් ඒ සඳහා තමන්ගේ පැනක් භාවිතා කිරීමට අවකාශ ඇති අතර, එම පැන නිල් හෝ කලු පැහැති බෝල තුඩු පැනක් විය යුතු ය. තවද එම ඡන්ද දායකයා විසින් රැගෙන එනු ලබන පැන යම් පක්ෂයක්/ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වන ආකාරයේ කිසිදු සලකුණක්/ වර්ණයක්/ ලාංඡනයක් සහිත එකක් නොවිය යුතු බවත් එවැනි පැන් ඡන්ද මධ්‍යස්ථානයට රැගෙන ඒමෙන් වළකින ලෙසත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. යම් ඡන්ද දායකයකුට ඡන්දය ලකුණු කිරීම සඳහා තමාගේ පැනක් ගෙන ඒමට හැකියාවක් නැතිවුවහොත් එවැනි ඡන්ද දායකයන් සඳහා ඡන්ද මධ්‍යස්ථානයේ දී විෂබීජහරණය කරන ලද බෝල තුඩු පැන් සැපයීමට ක්‍රියාකරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2020.08.01